ඌව පළාත් සභාව 2023 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

* මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළයුතු වුවද ඌව පළාත් සභාවට එරෙහිව පවරා තිබුණු විභාගවන නඩු කටයුතු 03 ක් සම්බන්ධයෙන් වූ රු. 320,274,129 ක අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | බැරකම් ප්‍රමාණවලට අදාළ නඩු මේ වන විටත් විභාග වෙමින් පවතින හෙයින් බැරකම් ප්‍රමාණය නිශ්චිතවම තීරණය වී නොමැති හෙයින් ගිණුමේ අනාවරණය කිරීම් යටතේ දක්වා නොමැත.<br><br>විගණන ඡේදයෙහි දක්වා ඇති නීති අංශය විසින් මීට පෙර වාර්තා කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට අදාළ රු. 303,274,129 ක මුදල පළාත් සභා අරමුදලින් ගෙවිය යුතු මුදලක් නොවන අතර එය පළාත් සභා අමාත්‍යාංශයේ ව්‍යාපෘති කාර්යාලයක් යටතේ කරන ලද ව්‍යාපෘතියට අදාළ මුදලක් වේ. එම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ යම් විටකදී ගෙවිය යුතු බැවින් මෙම මුදල පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැක. පළාත් සභා අරමුදලේ මූල්‍ය | නඩු පවරා ඇත්තේ පළාත් සභාවට එරෙහිව බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශනවල දක්වනුයේ පළාත් සභා අරමුදලින් ගෙවිය යුතු බැරකම් පමණක් බව සඳහන් කරමි. | |
| (ආ) | 2023 වර්ෂයේ වාණිජ අත්තිකාරම් ගිණුම් 04 කට අදාළව උපයන ලද එකතුව රු. 39,656,320 ක් වූ ලාභය පළාත් සභා මුදල් රීති 510.2(ආ) ප්‍රකාරව පළාත් සභා අරමුදලට බැර කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ වන මෙම ලාභයන් වර්ෂයේ ගිණුම් සකස් කර ලාභයන් හඳුනා ගැනීමෙන් අනතුරුව 2024 වර්ෂයේදී ප්‍රේෂණයන් වශයෙන් ලබා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. | පළාත් සභා මුදල් රීති 510.2(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ලාභය වෙනුවට 2022 වර්ෂයට අදාළ රු. 7,812,300 ක ලාභය සමාලෝචිත වර්ෂයේ ලාභ වශයෙන් සටහන් වලින් අනාවරණය කර තිබුණි. | පළාත් අරමුදලේ අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන විටදී කර්මාන්ත දෙපාර්තමේන්තුවට අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් සකස් කර ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් අදාළ වර්ෂයේ ලාභ අලාභ ගැලපීම් සිදු කර නොමැත. නමුත් ඒ වන විට පළාත් සභා අරමුදලට වාර්තා කර ඇති අවසන් වර්ෂයේ තොරතුරු පදනම් කර ගෙන හෙළිදරව් කිරීම් දක්වා ඇත. | වර්ෂය සඳහා උපයන ලද ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 04 කට අදාළව 2023 වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද රු. 22,562,776 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය වලට සමාන මුදලක් පළාත් සභා මුදල් රීති 509.1 ප්‍රකාරව පළාත් භාණ්ඩාගාර ක්ෂය සංචිත අරමුදලට බැරකර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ වන මෙම ක්ෂය සංචිත වටිනාකම වර්ෂයේ ගිණුම් සකස් කිරීමෙන් අනතුරුව 2024 වර්ෂයේදී ලබා ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. මීට පෙර වර්ෂයන්වලදී ද අදාළ වර්ෂයේ ක්ෂය සංචිත ඊට පසු වර්ෂයේදී ප්‍රේෂණය කර ඇති බව සඳහන් කරමි. | පළාත් සභා මුදල් රීති 509.1 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ඌව පළාත් සභාවේ ආයතන 07 කට අදාළ රු. 208,371 ක් වටිනා බැරකම් පළාත් සභා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබීම සහ අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම්වල වටිනාකම එම ශේෂයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී බැරකම් ලෙස හඳුනා නොගෙන හා බැරකම් ලෙස ගිණුම්ගත කිරීමට වාර්තා කර නොමැති මෙම බිල්පත් වටිනාකම 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2023 වර්ෂයට අදාළ අතිරික්ත හා ඌනතාවය තුළ ගැලපීමට සටහන් තබා ඇත. | බැරකම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ විසර්ජන ගිණුමේ මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු ශේෂය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව ඉදිරිපත් කර තිබුණු එම ශේෂ සමඟ රු. 425,700 කින් නොසැසඳුණි. | අදාළ ආයතනය විසින් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වී ඇති වෙනස්කම් (අපහරණය/ /හුවමාරු කිරීම්) සම්බන්ධ තොරතුරු වාර්තා කිරීමෙන් අනතුරුව යම් වෙනස්කමක් සිදු වී ඇති බව අනාවරණය වේ. මෙමගින් යම් බලපෑමක් සිදු වී ඇති නම් එය ඉදිරි | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු ආයතනවල ඇතුළත් තොරතුරු |

| | |
|---|---|
| වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සමඟ එකඟ විය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවධානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 700 - ආණ්ඩුකාරවර කාර්යාලය

**(අ) අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **ජනාධිපති චක්‍රලේඛ** | | | |
| **(i)** | 2018 ඔක්තෝම්බර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11-18 දරන රාජ්‍ය වියදම් කළමණාකරණ චක්‍රලේඛය | පළාත් සභාවල ආණ්ඩුකාරවරුන්ට සහ එතුමන්ලාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයට හිමිවිය යුතු පහසුකම් පිළිබඳව චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා තිබුණ ද ඊට අනුකූල නොවන ලෙස පෞද්ගලිකව දැරිය යුතු රු.808,334 ක වියදම් පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ඌව පළාත් ආණ්ඩුකාරවර නිල නිවසේ භාවිතය සඳහා ගෑස් ලබාදුන්නද මේවා ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික පරිහරණය සඳහා එතුමා වෙත ලබාදීමක් සිදු නොවේ. | ජනාධිපති ලේකම් චක්‍රලේඛය අනුව කටයුතු කර වියදම් කළමනාකරණය කළ යුතුය. |
| **(ii)** | ජනාධිපති ලේකම්ගේ අංක PS/CSA/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 4.3 වගන්තිය හා 2014 ජනවාරි 01 දිනැති පළාත් සභා ලේකම්වරුන් ඇමතු අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (II) ඡේදය | ඉන්ධන දීමනා බිල්පත් මත කරනු ලබන ප්‍රතිපූර්ණයක් ලෙස නොව මාසික දීමනාවක් ලෙස ගෙවිය යුතු බවත්, එහිදී අදාළ මාසයේ පළමුවන දින දේශීය වෙළඳපොලෙහි පවතින ඉන්ධන මිල අනුව දීමනා තීරණය කළයුතු බවත් සඳහන් කර තිබුණ ද, ඊට අනුකූල නොවන පරිදි ඌව පළාත් ආණ්ඩුකාර වරයා සහ ඔහුගේ සම්බන්ධීකරණ ලේකම්, පුද්ගලික ලේකම්, මාධ්‍ය ලේකම් | ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සහ එම කාර්යය මණ්ඩලය වෙත වෙන්කර ඇති UP CAG 7655, UP CAR 0550, UP CAR 1602, UP CAR 0895, සහ CAV 2060 දරන යුරෝපයේ සහ ජපානයේ නිෂ්පාදිත නවීන වාහන සඳහා ලංකාවේ භාවිතා කරනු ලබන ඉන්ධන වලින් | ඉන්ධන භාවිතය කළමනාකරණය කර ගැනීම වාහන භාවිතා කරන නිලධාරීන්ගේ වගකීමක් වන අතර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හා මහජන සම්බන්ධතා නිලධාරී වෙත 2022 අගෝස්තු සිට 2023 ජුනි දක්වා සුපිරි ඩීසල් වෙනුවෙන් ඉන්ධන ගාස්තු රු.2,439,475 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සුපර් ඩීසල් භාවිතා කරන ලෙස දේශීය නියෝජිත ආයතන විසින් ලිඛිතව දන්වා පැවැතීම හේතුවෙන් නඩත්තු සහ සේවා පිරිවැය අවම කර ගැනීමේ අවශ්‍යතාවය මත සුපර් ඩීසල් සපයා ඇත. ඔබ විසින් පෙන්වා දුන් චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් සියලු වාහන සඳහා 2023 අප්‍රේල් මස සිට සමාන්‍ය ඩීසල් භාවිතා කරන නමුදු, එම රථ වාහනවල ඉන්ධන දහන පද්ධතිය (Injector system) තුළ දෝෂ මතුවී වාර්ෂික වායු විමෝචන පරික්ෂාව ද අසමත්වීමේ තත්ත්වයක් නිරීක්ෂණය වුනු බව සඳහන් කරන අතර, එම හේතුවෙන් නඩත්තු වියදම් වැඩිවීම් තත්ත්වයක් දක්නට ලැබේ. |

**1.5.2 ශීර්ෂය 701 - සභා ලේකම් කාර්යාලය**

**(අ) අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **ජනාධිපති චක්‍රලේඛ** | | | |
| 2022 ඔක්තෝබර් 28 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11-18(II) දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය පළාත් සභා යන මැයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය | සභාපතිවරයාට නිල වාහන 01 ක් සහ එම නිල වාහනය සඳහා පෙට්‍රල්/ඩීසල් ලීටර් 400 ක මිලකට සමාන මාසික ඉන්ධන දීමනාවක් හිමිවන අතර එම දීමනාව අදාළ මාසයේ පළමුවන දින දේශීය වෙළඳපොලෙහි පවතින ඉන්ධන මිල අනුව තීරණය කළයුතු බව දක්වා තිබුණි. එසේ | 2024 වර්ෂයේ සිට සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිළ ගණන්වලට අනුව ඉන්ධන දීමනාව ලබාදෙන නමුත් වාහනයේ තාක්ෂණික දෝෂ ඇති විය හැකි බැවින් දැනටත් එම වාහනය සඳහා විශේෂිත | චක්‍රලේඛය අනුව කටයුතුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | වුවද ඊට අනුකූල නොවන පරිදි සුපිරි ඩීසල් ලීටරයක මිල පදනම් කරගෙන 2023 වර්ෂය සඳහා රු. 344,800 ක් වැඩිපුර ඉන්ධන දීමනාවක් ගෙවීම් කර තිබුණි. | පෙට්‍රල් පමණක් භාවිතා කරනු ලබන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම්දී ඇත. |

**(ආ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් දරන සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 05 කට, එම නිලධාරීන්ගේ පැමිණීම් පිටවීම් ලේඛන, අත්සන් නොකිරීම හා ඉටුකළ රාජකාරි පරීක්ෂා කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත නොකර සභාපතිවරයා විසින් සහතික කරන ලද පැමිණීම් පිටවීම් වාර්තාව පමණක් පදනම් කර ගනිමින් 2023 වර්ෂයේ දින 365 න් දින 362 ක් වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු. 1,943,414 ක් ගෙවා තිබුණි. | 2024 අප්‍රේල් මස සිට වැටුප් ගෙවීම සඳහා මාසික පැමිණීමේ ලේඛනයේ පිටපතක් සහතික කර ඉදිරිපත් කෙරේ. | ගෙවීම් කිරීමේ දී පිළිගත හැකි සාක්ෂි මත ගෙවීම් කිරීමට පියවර ගත යුතුය. |

**1.5.3 ශීර්ෂය 704 - ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ ඉඩම් පිළිබඳ අමාත්‍යාංශය**

**(අ) හඳුනා ගන්නා ලද පාඩු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජනවාරි 27 දින ප්‍රධාන අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරෙකු බීමත්ව සිටියදී රිය පදවා අමාත්‍යාංශයට අයත් ටොයෝටා වර්ගයේ කැබ් රථයක් 2015 මැයි 15 දින රිය අනතුරකට ලක්කර රු. 1,486,547 ක අලාභ හානියක් සිදුකර තිබුණි. ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයේ මාධ්‍ය ලේකම්වරයාගේ රාජකාරි සඳහා පවරා දී තිබූ මෙම කැබ් රථය රිය අනතුරකට ලක්කිරීමට වැරදිකරු වී සිටි රියදුරුට එරෙහිව නඩු පවරා තිබුණු අතර සිදු වූ ඉහත හානිය 2023 අගෝස්තු 10 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභය වන රු. 1,486,547 ක මුදල අයකර ගැනීම සඳහා බදුල්ල දිසා අධිකරණයේ එම්/9872 අංක යටතේ නඩු පවරා ඇති අතර නඩු තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | නඩු තීන්දුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය 705 - ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය**

**(අ) ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය ඌව පළාත තුළ සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම සඳහා බණ්ඩාරවෙල දුම්රියපොළ ස්ථානය අසල අදියර 03 ක් යටතේ නැරඹුම් වේදිකාවක් හා ගිමන්හලක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. එහි පළමු අදියර යටතේ රු.2,232,537 ක් වැයකර නැරඹුම් වේදිකාව පමණක් ඉදිකර තිබුණි. 2023 නොවැම්බර් 20 වන විටද නැරඹුම් වේදිකාවට පිවිසෙන පඩිපෙල අර්ධ වශයෙන් නිමකර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතියද ඇස්තමේන්තු ප්‍රකාරව පඩිපෙල සඳහා සම්පූර්ණ වටිනාකම වූ රු.552,543 ක් ගෙවා තිබුණු අතර පසුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නතර කර දමා තිබීමෙන් ව්‍යාපෘති පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර වැය කරන ලද රු.2,232,537 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | රේඛීය සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මුදල් යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ව්‍යාපෘතිය ඉටු කිරීමේ අරමුණින් පළාත් සභා සංචාරක අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ 2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.<br><br>ඒ අනුව මුල් අදියර වෙනුවෙන් ලද මුදලින් 2022 වසරේ ව්‍යාපෘතියෙන් කොටසක් නිමකළ අතර ඉතිරි වැඩ අවසන් කිරීම වෙනුවෙන් රේඛීය සංචාරක අමාත්‍යාංශය මගින් මෙම වසර තුළ අක්මුදල් ලබා දීමට නියමිත වේ. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. |

**1.5.5 ශීර්ෂය 706 - කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බීජ අර්තාපල් ගිණුමේ හිඟ ණය ශේෂය රු. 8,832,473 ක් වූ අතර එම ශේෂය වර්ෂ 10 කට අධික කාලයක් පළාත් සභා මුල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණි. ණය වාරික මාසිකව ක්‍රමාණුකූලව අයවී නොමැති බව පසුගිය වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ අයකර ගැනීම් ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. | 2024 ජනවාරි 01දින සිට 2024 මැයි 10 දින දක්වා ණය අයකර ගැනීමේ වර්තමාන ප්‍රගතිය රු.390,526 කි. ඒ අනුව තව දුරටත් අයකර ගැනීමට ඇති හිඟ ණය ශේෂය රු.8,441,768 කි. | ණය ශේෂය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 ශීර්ෂය 707 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභ සාධන අමාත්‍යාංශය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ මූලික අරමුණක් ලෙස (Disbursement Linked Indicator- 3) මගින් පෙන්වා දී ඇති පරිදි අදාළ රෝහල් බල ප්‍රදේශයේ වයස අවුරුදු 35 ට වැඩි වාර්ෂිකව ඉලක්කගත පුද්ගලයින්ගෙන් සියයට 25 ක අවමයක් සඳහා රෝගීන් ලියාපදිංචි කර අවදානම් රෝගී තත්ත්වයන් අඛණ්ඩව විනිශ්චය සිදුකළ යුතු වුවද, 2022 වර්ෂයේ මොනරාගල හා බදුල්ල දිස්ත්‍රික්කයේ පිළිවෙලින් රෝහල් 09 ක් සහ රෝහල් 12 ක ඉහත අරමුණු ඉටුකර ගැනීමේ අපේක්ෂිත ඉලක්ක ලඟාකරගෙන නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් දේවතුර සහ ගොඩිගමුව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවල රෝග විනිශ්චයන් සිදුකළ ගණන සහ අරමුණු වලට ළඟාවීමේ ප්‍රතිශතය බින්දුවක් ලෙස සටහන් කර තිබුණ ද මෙම රෝහල්වල 2022 වර්ෂයේ රෝගීන් විනිශ්චය කිරීම අඛණ්ඩව සිදුකර ඇති අතර අදාළ අරමුණු කරා ළඟාවී ඇති බව සඳහන් කරමි. අදාළ රෝහල් තුළ අන්තර්ජාල පහසුකම් නොමැතිවීම, රෝහල් Verifiable රෝහල් බවට පත්වීම ප්‍රමාදවීම , 2021 හා 2022 වර්ෂවල රටේ පැවති අයහපත් වාතාවරණය යනාදී කරුණු හේතුවෙන් අදාළ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇත. | පරිගණක මෘදුකාංග සකස්කර රෝහල් ජාලගතව සම්බන්ධ කර ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු. 1,190,000 ක් වටිනා Treadmill sprit fitness ව්‍යායාම උපකරණය 2023 ජූලි 04 දින වන විටත් බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගබඩාවන්හි නිෂ්කාර්යව පැවතුණි. | නව ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම මත මෙම උපකරණ ස්ථාපිත කිරීම ප්‍රමාද විය. මේ වන විට ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අදාළ ව්‍යායාම් උපකරණ සවිකිරීමට මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. | ව්‍යායාම් උපකරණය සවිකිරීමට කටයුතු කර ප්‍රයෝජනයට ගත යුතුය. |

**1.5.7 ශීර්ෂය 708 - මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමූපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් මාර්ග අමාත්‍යාංශයේ 2023 ඔක්තෝබර් 05 සිට සේවය හැර ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු එකතුව රු. 246,100 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4:5 වගන්තිය යටතේ හිඟ ණය මුදල් ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු. 4,134,642 ක් වූ ගමේවෙල ජල යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 මැයි 11 දින රු.මි. 03 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 31 දිනට අවසන් කළ යුතුව පැවතියදී 2024 ජනවාරි 23 දින වන විටත් කාණු කපා නල එළීම පමණක් සිදුකර තිබුණි. | මේ වනවිට ව්‍යාපෘතියේ සම්පූර්ණ වැඩ අවසන් කර ඇතත් ජල පොම්පය සඳහා තෙකලා විදුලිය ලබාගැනීමට ඇති අතර මේ සඳහා මෙම වර්ෂයේ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන මගින් මුදල් වෙන් කර ඇත. විදුලිබල මණ්ඩලයෙන් ඇස්තමේන්තුව ලබාගත් පසු කඩිනමින් විදුලිය ලබාගෙන අවහිරතාවයකින් තොරව ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභ ලබා ගත හැක. | කඩිනමින් පිරිසිදු පානීය ජලය ලබාදීමට පියවර ගතයුතුය. |

## 1.5.8 ශීර්ෂය 709 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

**කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ) පළාත් සහා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල (පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හැර)

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ද්විතික මට්ටමේ නිලධාරීන් 215 ක් හා වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 256 ක් අතිරික්ත සේවයේ යොදවාගෙන තිබුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 686 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | කාර්ය මණ්ඩලය තුලනාත්මකව පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගුරු සහායක කාර්ය මණ්ඩලය 1284 ක් සහ වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) සේවකයින් 17 ක් අතිරික්තව සේවයේ යොදවාගෙන තිබුණි. විදුහල්පති සේවයේ තනතුරු 562 ක් සහ ගුරු සේවයේ තනතුරු 2891 ක් පුරප්පාඩුව පැවතුණි. | 2023 වර්ෂයේ විදුහල්පති සේවයට බඳවාගත් විදුහල්පති සේවයේ පුරප්පාඩු පැවති තනතුරු 331 ක් පුරවා ඇත. එසේම ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා මේ වන විට බඳවා ගැනීම් සිදුකරනු ලබන නිලධාරීන්ගෙන් පුරවා ගැනීමට කටයුතු කරමි. | ගුරුවරුන් හා විදුහල්පතිවරුන් තුලනයක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

**(ඇ) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතික හා ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව 624 ක් වූ අතර එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඌන තනතුරු සඳහා නිලධාරීන් අදාළ පුහුණු විද්‍යාල වලින් පුහුණුවීම් කටයුතු අවසන් වූ පසු මෙම තනතුරු සඳහා ෆේඛීය අමාත්‍යාංශයෙන් බඳවාගෙන ඌව පළාත් සභාවට බඳවාගත් පසු පුරප්පාඩු සහිත ආයතන වලට ස්ථානගත කිරීම සිදු කිරීමට අපේක්ෂිතය. මේ වන විට පුරප්පාඩු වී ඇති උපස්ථායක, සුළුසේවා පාලක, දුරකථන ක්‍රියාකරු හා සෞඛ්‍ය රසායනාගාර සහායක යන තනතුරු සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා, සම්මුඛ පරීක්ෂණ සිදුකර ඉන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද සේවකයන් බඳවා ගැනීමට කටයුතු සිදුකර ඇති අතර, එලෙස තෝරාගත් සේවකයන් සඳහා තනතුරු වලට අදාළ පුහුණුව ලබාදීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. | කාර්ය මණ්ඩලය තුලනාත්මකව පවත්වාගෙන යාමට පියවර ගත යුතුය. |

**1.5.9 ශීර්ෂය 710 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දියතලාව, මහියංගනය හා වැලිමඩ රෝහල්වල ඖෂධ ගබඩාවල 2023 ඔක්තෝබර් 11 දිනට රු. 6,737,293 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ, රු. 1,168,303 ක් වටිනා තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ සහ රු. 4,141,049 ක් වටිනා ඖෂධ තොග භාවිතා කිරීම සම්බන්ධයෙන් නිශ්චිත තීරණ ලබා නොදී තාවකාලිකව භාවිතය නවතා දැමූ ඖෂධ ගබඩාවල රඳවා තබාගෙන තිබුණි. | 2019, 2020, 2021 හා 2022 මුල දක්වා පැවති කොවිඩ් වසංගතය හමුවේ කොවිඩ් රෝගය සඳහා බොහෝ පිරිස් ප්‍රතිකාර ලැබුවද සාමාන්‍ය බාහිර රෝගී අංශය හා වෙනත් රෝග සඳහා වැයවන ඖෂධවල භාවිතා වීම අඩුවිය. මුළු දිවයින පුරා මෙම තත්ත්වය බලපාන අතර එම ඖෂධ භාවිතා කිරීමෙන් තොරව කල් ඉකුත් වීම සිදුවිය.<br>එසේම ඇතැම් ඖෂධ ජීවිතාරක්ෂක සේවාව සඳහා අතිශයින්ම අත්‍යවශ්‍ය වන අතර ඒවා කල් ඉකුත් වන දිනය තෙක් රෝහල තුළ රඳවා ගැනීමට සිදු වේ.<br>එසේම,<br>• Atrophin sulphate<br>• Aminophilin | කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් ඖෂධ විධිමත් පරිදි බැහැර කිරීමට පියවර ගත යුතු අතර ඖෂධ කල්ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වැනි ඖෂධ වෙනත් රෝහලක් තුළට යවා ඒ වෙනුවට අලුත් තොග ගෙන්වා ගන්නා අතර, මෙම ඖෂධ බොහෝමයක් ජීවිතාරක්ෂක ඖෂධ වේ. තත්ත්වයෙන් අසමත් ලෙස හඳුනාගෙන වාර්තා කර ඇති ඖෂධ සම්බන්ධව නියමිත පරිදි කටයුතු කොට වෙන් කර තැබීමට පියවර ගෙන ඇත. ඉදිරියේදී අවශ්‍ය උපදෙස් ලබා දුන් පසු ඒ අනුව කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස නිලධාරීන්ට බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් උපදෙස් ලබා දී ඇත. | |
| **(ii)** | වැල්ලවාය මූලික රෝහලේ ඖෂධ ගබඩාවේ 2023 නොවැම්බර් 24 දිනට කල් ඉකුත් වූ ඖෂධ තොගවල වටිනාකම රු.2,007,281 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ඖෂධ වලින් වැඩි ප්‍රමාණයක් කොරෝනා උවදුර පැවති කාල සීමාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වේ. එවකට රට තුළ පැවති කොරෝනා උවදුරු හේතුවෙන් රෝහල් වෙත පැමිණි රෝගීන්ගේ සංඛ්‍යාව අඩු වීම නිසා රෝගී සත්කාර වෙනුවෙන් ඇණවුම් කරන ලද ඖෂධ භාවිතය අඩු විය. රෝහල විසින් හැකි සෑම විටම ඖෂධ අපතේ යාම වලක්වා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා තිබුණු නමුත් සැලකිය යුතු ඖෂධ ප්‍රමාණයක් කල් ඉකුත් වී ඇත. දිවයින පුරා සෑම රෝහලකම මෙම තත්ත්වය පොදුවේ දක්නට ලැබේ.<br><br>තවද, කොරෝනා කාලය තුළ වෙනත් රටවලින් (කොළඹ ඖෂධ ගබඩාවට) විශාල වශයෙන් ආධාර ලෙස ඖෂධ ලැබී තිබූ අතර ඇණවුම් කිරීමකින් තොරව එම ඖෂධ රෝහල් වෙත නිකුත් කර ඇත. එම ඖෂධ වලින් විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වීමට ආසන්නව පැවතුණ ඖෂධ විය. එම කරුණු හේතුවෙන් ඖෂධ විශාල ප්‍රමාණයක් කල් ඉකුත් වූ ඖෂධ ලෙස ගබඩා කර තැබීමට සිදු වී ඇත. | කල් ඉකුත් වීමට පෙර ඖෂධ ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතු අතර කල් ඉකුත් වූ ඖෂධ විධිමත් පරිදි බැහැර කළ යුතුය. |

**(ආ) දෘෂ්‍ය අක්‍රමිකතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2018 වර්ෂයේ සිට 2021 දක්වා වැලිමඩ මූලික රෝහල විසින් බොරලන්ද, බෝගහකුඹුර සහ ඌව පරණගම යන ප්‍රාදේශීය රෝහල් වෙත නිකුත් කරන ලද ඖෂධ අයිතමයන් 09 කට අදාළව නිකුත් | අප දෙපාර්තමේන්තුව මගින් බණ්ඩාරවෙල විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව වැලිමඩ මූලික රෝහලේ ඖෂධ | තොග ඌනතාවය සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂණ සිදුකළ |

| | | | |
|---|---|---|---|
| | කිරීමේ නියෝග සහ ලැබීම් නියෝග හා සැසඳීමේ දී රු.2,402,678 ක් වටිනා ඖෂධයන්හි ඌනතාවයක් පැවතුණි. ඌනතාවය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ගබඩාවේ සිදුකර ඇති අක්‍රමිකතා සම්බන්ධව බණ්ඩාරවෙල පොලීසිය විසින් ඖෂධවේදී ඩී.එම්.දුමින්ද දේශප්‍රිය දිසානායක මහතා 2024 පෙබරවාරි 14 වන දින අත් අඩංගුවට ගෙන 2024 පෙබරවාරි 15 වැලිමඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එදින සිට බන්ධනාගාර ගත කර ඇත. ඒ අනුව නැවත ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක. 5/AD/8/232 හා 2024 පෙබරවාරි 19 දිනැති ලිපිය මගින් ඔහුගේ රාජකාරි වැඩ තහනම් කර ඇත.<br>මේ සම්බන්ධව අප දෙපාර්තමේන්තුව මට්ටමෙන් විමර්ශන කටයුතු සිදුකරන ලද අතර, බණ්ඩාරවෙල විශේෂ අපරාධ විමර්ශන අංශය මගින් ද විමර්ශන කටයුතු සිදු කරමින් පවතී, එබැවින් මේ සම්බන්ධව ඉදිරි තොරතුරු පසුව ලබාදිය හැකිය. | යුතු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ii)** | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැලිමඩ මූලික රෝහලේ ඖෂධ ගබඩාවෙන් රෝහල් සායනයන්ට නිකුත් කරන ලද රු.4,918,840 ක් වටිනා ඖෂධ 06 ක් අදාළ සායනයන් වෙත ලැබී නොතිබුණු බැවින් රෝගීන්ට එම ඖෂධ ලබාදී නොතිබුණි. | - එම - | - එම - |
| **(ඇ)** | **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්** | | |
| **(i)** | පූර්ව අවශ්‍යතා හඳුනා ගැනීමකින් තොරව බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු එකතුව රු. 1,457,407 ක් වූ උපකරණ රෝහල් වෙත නිකුත් කර තිබුණ ද රෝහල් විසින් උපකරණ භාවිතා නොකර බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත නැවත භාරදී තිබුණි. | රෝගීන් ලියාපදිංචිය හා පුද්ගලික සෞඛ්‍ය අංක (Personal Health Number – PHN) ලබාදීම තුළින් සෞඛ්‍ය පහසුකම් ලබාදීම හා ඔවුන්ගේ තොරතුරු ලබාගැනීම කාර්යක්ෂම කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණක් වන බැවින් PH Number ජනතාවට ලබාදීම සඳහා Bar Cord Readers හා Card Printers රෝහල් වෙත ලබාදෙන ලදී. නමුත් එම කාඩ් පත් මුද්‍රණය කිරීමේදී ඒ සඳහා අවශ්‍ය කාඩ්පත් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් Card Printers වෙනුවට සාමාන්‍ය මුද්‍රණ කඩදාසි භාවිතයට යොදා ගත හැකි printers භාවිතයට ගැනීමට තීරණය කරන ලදී. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2019 සිට 2023 දක්වා කාලපරිච්ඡේදයට අදාළව මිල දී ගෙන තිබුණු වටිනාකම රු. 11,082,139 ක් වූ වෛද්‍ය හා අනෙකුත් කාර්යාල උපකරණ අයිතම 04 කට අදාළ ඒකක 99ක් 2023 ජූලි 04 දිනටත් අපේක්ෂිත පරමාර්ථය සඳහා යොදා නොගෙන, නිශ්කාර්යව පැවතුණි. | මේ වන විට "ස්වස්ථ" වැඩසටහන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක මට්ටමට පැමිණ ඇති අතර ඖෂධ ඉල්ලුම් කිරීම හා නිකුත් කිරීම, ඇතුළු රෝහල් සත්කාරක කාර්යයන් Digital ක්‍රමවේදයට අනුව ක්‍රියාත්මක වේ. ඒ අනුව වර්තමානය වන විට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන රෝහල් හා සෞඛ්‍ය ආයතනවල විවිධ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඉහත සඳහන් උපකරණ ලබාදෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.<br>මේ වන විට අප කාර්යාලය මගින් එම ඉල්ලීම් අධ්‍යනය කර අවශ්‍ය උපකරණ එම ආයතන වෙත ලබාදීමට කටයුතු කරමින් පවතින බව වාර්තා කරන අතර 2023 වර්ෂයේ දෙසැම්බර් අවසානයට පෙර විමසුමේ සඳහන් සියලු ඌන උපයෝජන උපකරණ නිසි ප්‍රයෝජන ලබාගත හැකි ආකාරයට බෙදා දී අවසන් කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ උපකරණ භාවිතා කළ යුතුය. |
| **(iii)** | 2022 වර්ෂයේ මිල දී ගෙන වැල්ලවාය මූලික රෝහල වෙත නිකුත් කර ඇති එකතුව රු.11,090,200 ක් වූ වෛද්‍ය උපකරණ 06 ක් විගණිත දින වූ 2023 ජූලි 18 දින වන විටත් ඖෂධ ගබඩාවේ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | මෙම වාර්තාවේ සඳහන් සියලුම උපකරණ වැල්ලවාය මූලික රෝහලේ දැනට ඉදිකරමින් පවතින ශල්‍යාගාරයේ භාවිතය සඳහා මිලදී ගන්නා ලද උපකරණ වේ. ශල්‍යාගාරයේ වැඩ අවසන් කළ වහාම මෙම උපකරණ භාවිතයට ගැනීම සිදුකරනු ලැබේ. | වෛද්‍ය උපකරණ නිෂ්කාර්යව නොතබා භාවිතයට ගත යුතුය. |

**(ඇ) සෞඛ්‍ය කාර්ය මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැල්ලවාය මූලික රෝහලට අදාළව 2023 නොවැම්බර් 23 දිනට පිළියෙළ කර ඉදිරිපත් කරන ලද කාර්යය මණ්ඩල වාර්තාවට අනුව එදිනට අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේ දී තනතුරු 08 ක අතිරික්ත කාර්ය මණ්ඩලය 31 ක් සිටිය දී අතිකාල දීමනා ලෙස රු.26,036,153ක්ද නිවාඩු දින වැටුප් ලෙස රු.15,285,884 ක් ගෙවා තිබුණි. | 2017 වර්ෂයේ අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අනුව එම සංඛ්‍යාව තුළින් රෝහල් සේවාවන් පුළුල්වීම නිසා සේවය ලබාගැනීම අපහසු වේ. එබැවින් අනුමත කාර්ය මණ්ඩලයට වඩා වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදවීමට සිදුවේ.<br>❖ රුධිර කාන්දු පෙරණ ඒකකයේ රාජකාරි පැය 24 පුරාම ලබාදිය යුතුය.<br>❖ ශල්‍ය වාට්ටු (පිරිමි/ ගැහැණු ) ආරම්භ කිරීම, මධ්‍යම වන්ද්‍යා කෘත්‍ය ඒකකය (CSSD) ආරම්භ කිරීම.<br>❖ ගිලන් රථ සේවාව පුළුල්වීම. | කාර්ය මණ්ඩල සමාලෝචනය කර අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරගත යුතුය. |

❖ අධිකරණ වෛද්‍ය සේවාව පුළුල් වීම.

❖ අක්ෂි සායන, මානසික රෝග සායන.

❖ සාමාන්‍ය පරිපාලන කටයුතු.

වැනි හේතුන් නිසා අනුමත කාර්ය මණ්ඩලයට වඩා සේවක සංඛ්‍යාවක් සිටියත් අතිකාල ගෙවීමට සිදුවේ.

**1.5.10 ශීර්ෂය 711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඌව පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 04 ක් 2021 හා 2022 වර්ෂ වලදී පාසල් සිසුන් සඳහා අවශ්‍ය නිල ඇඳුම් ඇණවුම් කිරීමේදී ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු කිරීමකින් තොරව ඇණවුම් කිරීම හේතුවෙන් වර්ග 47 කට අයත් රු. 2,469,687 ක් වටිනා නිල ඇඳුම් කට්ටල 6424 ක් එම කාර්යාලවල ගබඩාවේ සහ සංවර්ධන අංශයේ ගොඩගසා තිබුණි. කල්ගත වීමත් සමඟ නිල ඇඳුම් රෙදිවල වර්ණය වෙනස්වීම, දිරාපත්වීම යනාදී කරුණු මත ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. | පාසල්වල සියලුම විදුහල්පතිවරුන් වෙත නියමිත වර්ගයන්ගෙන් සහ ප්‍රමාණයෙන් නිල ඇඳුම් ඇණවුම් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර, එම ඇණවුම් සම්බන්ධ සාරාංශ වාර්තාවක් සකස් කිරීමටත් වැඩිදුරටත් දන්වා ඇත. 2023 වර්ෂයේ අතිරික්තව පවතින නිල ඇඳුම් සම්බන්ධයෙන් කලාප මට්ටමින් දුෂ්කර සහ අති දුෂ්කර පාසල් වෙත බෙදාහැරීම සඳහා ලේඛන සකස් කර ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මගින් අධ්‍යාපන අමාත්‍යාංශය ඉසුරුපාය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, මේ දක්වා ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති අතර අනුමැතිය ලැබීමෙන් පසු සකස් කර ඇති ලේඛනයට අනුව එම අතිරික්ත නිල ඇඳුම් බෙදා හැරීමට කටයුතු කරමි. | පාසල් නිල ඇඳුම් අවශ්‍යතාවය නිශ්චිතව ගණනය කර නිල ඇඳුම් ඇණවුම් කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ "තම ප්‍රදේශයේ පවත්නා කර්මාන්තවලට අදාළව ඒවායේ ඵලදායිතාවය ඉහළ නැංවිය හැකි නව ක්‍රම පිළිබඳව ගවේශනය කිරීම හා ඒ අනුව උචිත උපකරණ සකස් කිරීම තුළින් ප්‍රදේශයට මෙන්ම දළ දේශීය නිෂ්පාදිතය නඟා සිටුවීමට දායක වීමට ශිෂ්‍ය අවධියේදීම ඉඩකඩ සැලසීම" අරමුණු කරගෙන මෙන්ම පාසල් සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතාව, තර්කානුකූල චින්තනය, සාමූහිකව ක්‍රියාකිරීම, මනා සංනිවේදනය හා අභියෝගවලට මුහුණදීමේ කුසලතාව වර්ධනය කිරීම අපේක්ෂා කර, පාසල් වෙත රු. 44,000,000 ක මුදල ප්‍රතිපාදන ලබාදී 2023 ජුලි 31 දින වන විට වසර 1 ½ ක් ගතවී | මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023 දෙසැම්බර් 18 සහ 19 දෙදින විදුහල්පති හා නව නිපැයුම් විෂයභාර ගුරු භවතුන් සඳහා පවත්වන ලදී. එහි දී මො/කතරගම ජාතික පාසලේ සිසුන් විසින් ජලයේ පවතින ආක්‍රමණශීලි ශාක එකතු කිරීමේ උපකරණයක් සකස් කර ඇති බවත්, මො/මල්ලාත්තාවල ජාතික පාසලේ සිසුන් color light උපකරණයක් ද බ/ධර්මපාල විද්‍යාලයේ සිසුන් විසින් කෘෂි නිෂ්පාදන ආශ්‍රිත අත්හදා බැලීම් සිදුකරන බව සඳහන් කර ඇත. පාසල් සිසුන්ගේ කැමැත්ත පවතින්නේ රොබෝ තාක්ෂණය සහ නව පරිගණක | ව්‍යාපෘති අරමුණු අනුව ප්‍රතිපාදන උපයෝජනයට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණ ද, අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි. | තාක්ෂණය සඳහා වන අතර, ප්‍රාදේශීය ගැටළුවලට විසඳුම් සෙවීමට යොමු වීමට මැලිකමක් දක්වයි. ඒ අනුව එම රොබෝ තාක්ෂණය හා නව පරිගණක තාක්ෂණයට අදාළව නිර්මාණ සකස් කර ඇත. | |

**(ආ) ආර්ථික නොවූ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාය යාමේ අවධානම්කාරී තත්ත්වයක් උද්ගතව පවතින භූමියක ගොඩනැගිලි ඉදිකිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRO) වාර්තාවක් ලබාගෙන එහි නිර්දේශ මත ඉදිකිරීම් කළයුතු වුවද එසේ නොකිරීමෙන් රු. 3,414,036 ක් වැයකර බ/සීවලී මහා විද්‍යාලයීය භූමිය තුළ ඉදිකර තිබුණු වැසිකිළි පද්ධති දෙකෙහි පිවිසුම් දොරටුව ආසන්නයටම නායයෑම හේතුවෙන් අවධානම්කාරී තත්ත්වයක් මත ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. | ඉවුර බාදනයට විසඳුමක් ලෙස ආරක්ෂිත පැති බැම්ම ඉදිකළ යුතු බැවින් ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර, මේ වන විට පළමු අදියර සඳහා ඉදිකිරීම් ආරම්භ කර ඇත. ඉවුරේ ඉහල පසින් පවතින වැසිකිළිවල වැසි ජලය පාසලේ ප්‍රධාන කාණුවට යොමු කිරීම සඳහා ද ඉහත කොන්ත්‍රාතුවට ඇතුළත් කර ඇත.<br><br>මේ වන විටත් වැසිකිළි පද්ධති දෙක භාවිතයට ගනිමින් පවති. | සිසුන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයට පියවර ගත යුතු අතර ඉදිකිරීම් සිදුකිරීමට පෙර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRO) නිර්දේශ ලබාගත යුතුය. |

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයේ ගබඩාව පරීක්ෂා කිරීමේදී වටිනාකම හඳුනාගත නොහැකි ලේසර්, HP හා Dell වර්ගයේ ලැප්ටොප් 03 ක් 2013 වර්ෂයේ සිට භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | වැල්ලවාය කලාප අධ්‍යාපන කාර්යාලයේ පරිගණක හා දෘඩාංග ජාලකරණ කණ්ඩායමේ සාමාජිකයන් විසින් 2024 ජනවාරි 31 දින සිදු කරන පරීක්ෂාවේදී මෙම ලැප්ටොප් 03 සකස් කිරීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීමේ දුෂ්කරතා අධික වියදමක් දැරීමට සිදුවීම ආදී කරුණු පදනම් කරගෙන භාවිතයෙන් ඉවත් කිරීමට සුදුසු බව නිර්දේශ කර ඇත. | ලැප්ටොප් පරිගණක ඵලදායී ලෙස භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**(ඈ) පාසල් කාර්ය මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප 06 ක් තුළ විධිමත් ගුරු තුලනයක් සිදු නොකිරීම හේතුවෙන් අනුමත ගුරු සංඛ්‍යාව ඉක්මවා ගුරුවරු පත්කර අතිරික්ත ගුරු කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම තුළ ග්‍රාමීය පාසල් 382 ක ගුරුවරු 2214 කගේ ඌනතාවයක් පැවැති අතර නාගරික පාසල් 165 ක ගුරුවරු 583 කගේ | සියලුම කලාප අධ්‍යාපන කාර්යාල විසින් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම මේ වන විට සිදුකර ඇත. එමගින් ගුරු තුළනය කිරීමට කටයුතු කර ඇත. | පළාත තුළ විධිමත් අයුරින් ගුරු තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතිරික්තයක් පැවතුණි. අතිරික්ත ගුරුවරුන් සඳහා 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වැටුප් වශයෙන් රු. 549,754,310 ක් ගෙවා තිබුණි. | | |
| **(ii)** | බණ්ඩාරවෙල, වැලිමඩ අධ්‍යාපන කලාප 02 කට අයත් ඇතැම් පාසල්වල නියෝජ්‍ය සහ සහකාර විදුහල්පති තනතුරුවල ඌනතාවයන් පැවතියදී එම කලාපවලම ඇතැම් පාසල්වලට අනුමත සීමාව ඉක්මවා නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිවරුන් 26 ක් පත්කර 2021 මැයි 01 සිට 2023 ඔක්තෝබර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ පමණක් වැටුප් වශයෙන් රු. 43,762,329 ක් ගෙවා තිබුණි. | පාසල්හි අනුමත සීමාව ඉක්මවා පත් කර ඇති නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීමට මේ වන විට කටයුතු කර ඇති බව සඳහන් කරමි. | විධිමත් කාර්ය මණ්ඩල තුලනයක් තුළින් එම විදුහල්පතිවරුන්ගෙන් ඵලදායි සහ කාර්යක්ෂම සේවයක් ලබාගත හැකිවන පරිදි පුරප්පාඩු පවතින පාසල්වලට අනුයුක්ත කර සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |
| **(iii)** | විදුහල්පති තනතුරුවල රාජකාරි ආවරණය කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ අංක අමප/12/1101/530/035 හා 2012 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඌව පළාතෙහි අධ්‍යාපන කලාප 10 ට අයත් පාසල් 118 ක සේවයේ නියුක්තව සිටි ගුරුවරුන් 120 ක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට පත්කර, තිබුණු අතර පත්වීමේ ලිපියේ කොන්දේසි අනුව වැටුප් ලබාගැනීමේ හිමිකම හැර වෙනත් කිසිදු හිමිකමක් නොලැබෙන බවට සඳහන් කර තිබියදී කොන්දේසියට අනුකූල නොවන පරිදි විදුහල්පතිවරුන් 110 කට 2013 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා විදුහල්පති දීමනා වශයෙන් රු. 22,972,094 ක් ගෙවා තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/4/60/01/13 හා 2009 පෙබරවාරි 26 දිනැති ලිපිය මගින් විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාවක් ලබාදීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකර ඇත. ඒ අනුව එදින සිට විදුහල්පතිවරුන් වශයෙන් සේවය කරන විදුහල්පති ශ්‍රේණිධාරීන් හා ශ්‍රේණිධාරීන් නොවන එහෙත් විදුහල්පති සේවයේ වැඩ බලන උප ගුරුවරුන් සඳහා මාසිකව ගෙවීම් සිදු කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/04/60/01/වි.දීමනා /2017 හා 2017 මාර්තු 14 දිනැති ලිපිය මගින් හා චක්‍රලේඛ අංක 16/2017 අනුව විදුහල්පතිවරුන් සඳහා ලබා දෙන විශේෂ දීමනාව සංශෝධනය කර ඇත. එම සංශෝධිත දීමනාව විදුහලිපතිවරුන් වශයෙන් සේවය කරන හා එම තනතුරු වල වැඩ බලන නිලධාරීන් සඳහා 2017 වර්ෂයේ මාර්තු මස සිට ගෙවීම් කර ඇත. ඌව පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අත්සනින් යුතුව ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති අංක 1/3/7-ix හා 2018 සැප්තැම්බර් 29 දිනැති ලිපිය මගින් ද වැඩබලන විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. | පත්වීම් ලිපි චක්‍රලේඛයට පසුව නිකුත් කර ඇති බැවින් පත්වීම් ලිපියේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුතුව සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත් සහිතව ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති අංක 9/ආ/8 හා 2018 ඔක්තෝබර් 03 දිනැති ලිපිය මගින් ද වැඩ බලන විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. ඉහත සඳහන් චක්‍රලේඛ හා ලිපි පදනම් කරගෙන විදුහල්පතිවරුන් සඳහා විදුහල්පති දීමනාව ගෙවා ඇත. | |
| **(iv)** | ඌව පළාත තුළ රසායනාගාරයක් රහිත පාසල් 27 ක් සඳහා රසායනාගාර සහායක සේවකයින් 32 දෙනෙකුද, පුස්තකාලයක් රහිත පාසල් 14 ක් සඳහා පුස්තකාල සහායක සේවකයින් 17 දෙනෙකු ද පත්කරමින් එකී සේවකයින් පත්කිරීමේ අරමුණු ඉටුකර නොගෙන නිශ්කාර්ය කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යමින් 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඔවුන්ට වැටුප් වශයෙන් රු. 28,621,714ක් ගෙවා තිබුණි. | රසායනාගාර සහායක සේවකයින් හා පුස්තකාල සහායක සේවකයින් රසායනාගාර සහ පුස්තකාල ක්‍රියාත්මක වන පාසල් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. | රසායනාගාර සහායක සේවකයින් හා පුස්තකාල සහායක සේවකයින් එම පහසුකම් පවත්නා පාසල් වල සේවය සඳහා යෙදවිය යුතුය. |
| **(v)** | ඌව පළාතේ අධ්‍යාපන කලාප 07 ක පාසල් 410 ක ගුරුවරු 2302 කගේ ඌනතාවයක් පැවතියදී එම අධ්‍යාපන කලාපවල පාසල් වලට පත්වීම් ලද ගුරුවරු 99 ක් එම අධ්‍යාපන කලාපයෙන් පිටත පාසල් වලට සහ ජාතික පාසල් වලට අනුයුක්ත කරමින් 2007 ජුනි සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ පත්වීම් වලට අදාළ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ඔවුන්ගේ මුල් පාසැලට අදාළව වැටුප් වශයෙන් රු. 38,446,523 ක් ගෙවා තිබුණි. | පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාරදුන් ගුරුභවතුන් මෙන්ම, වෛද්‍ය හේතූන් මෙන්ම දරුප්‍රසූතියට ආසන්න නිලධාරීන්ගේ ඉල්ලීම් පදනම් කර ගනිමින් අනුයුක්ත කිරීම් සිදුකර ඇත. | අනුයුක්ත කිරීම් නොකර වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

**(ඉ) වත්කම්වලින් ලැබිය යුතු ආදායම ලබානොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන කලාප 04 ක ගුරු විදුහල්පති රජයේ නිවාස 549 ක් අතුරින් නිවාස 77 ක් භාවිතා කළ නොහැකි ලෙස අබලන් වී හෝ ඌන උපයෝජිතව පැවතුණි. | මහියංගනය අධ්‍යාපන කලාපයේ පාසල් තුළ පිහිටා ඇති ගුරු නිවාස 199න් ගුරු නිවාස 94 ක පදිංචිකරුවන් සිටින අතර, ඉතිරි නිවාස 105 න් ගුරු නිවාස 27 ක් 2024 වර්ෂයේ අලුත්වැඩියා කිරීමට සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ඇත. | නිල නිවාස අබලන් වී යාම වලක්වා ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |

### 1.5.11 ශීර්ෂය 712 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

**(අ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය**

**හිඟ ආදායම්**

| | | | |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන 28 කට අදාළව ලැබිය යුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් එකතුව රු. 1,245,683,636 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ද අයකර ගෙන නොතිබුණි. | මෙම හිඟ ආදායම් පෙර වර්ෂවල සිට පළාත් පාලන ආයතන ඉදිරියට ගෙනා ආ හිඟ ආදායම් ශේෂ වේ. 2020 හා 2021 වර්ෂවල පැවැති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ හා 2022 වර්ෂයේ රටේ පැවැති ආර්ථික අර්බුදය නිසා මෙම හිඟ ආදායම් අයකර ගැනීමේ කටයුතු අපේක්ෂා කළ ආකාරයෙන්ම සිදුකර ගත නොහැකි විය. මේ සම්බන්ධව 2022 වර්ෂයේ පැවැති විගණන කළමනාකරණ කමිටුවල දී ද සාකච්ඡා කරන ලදී. ඒ අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් පළාත් පාලන ආයතන වෙත මේ වන විටත් ලබා දී ඇත. | පනත්, මූල්‍ය හා පරිපාටි රීති සහ අතුරු ව්‍යවස්ථා අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | මහා නගර සභා ආඥා පනත (252) අධිකාරය, නගර සභා ආඥා පනත (255) අධිකාරය සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට අය විය යුතු උසාවි දඩ එකතුව රු. 134,107,125 ක් හා මුද්දර ගාස්තු එකතුව රු.290,178,301 ක් පළාත් පාලන ආයතන වලට ලැබී නොතිබුණි. | 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ඌව පළාත් ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද සියලුම උසාවි දඩ හා මුද්දර ගාස්තු අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවා ඇත. | අදාළ පනත්වල විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**(ආ) නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල නිලධාරීන්ට හා සභිකයින්ට පනවා තිබුණු අධිහාර වෙනුවෙන් එකතුව රු. 4,343,581 ක් අය විය යුතුව තිබුණි. | අධිහාර මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් පළාත් පාලන ආයතන වෙත මේ වන විටත් ලබා දී ඇත. | පළාත් පාලන ආයතන වලට අදාළ පනත්වල විධිවිධාන අනුව අධිහාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) වාහන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2022 මැයි 09 දින සිදු වූ අරගල අවස්ථාවේදී මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයක් අවිධිමත්ව හා අවසරයකින් තොරව කොළඹ නගරයට රැගෙන ගොස් ආපසු ඒමේදී | 2022 මැයි 09 දින සිදු වූ අරගල අවස්ථාවේදී මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයක් කැරලි කෝලාහලයකට මැදිව ගිණිගෙන | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| පුද්ගලයන්ගේ ප්‍රහාරයකට ලක්ව විනාශ වී තිබුණු අතර එහිදී රජයේ දේපල විනාශ වීමට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. විනාශ වී තිබුණු රථයේ රක්ෂණ හිමිකම ලබාගැනීමට නීතිමය කටයුතු සිදුකරමින් තිබුණි. | විනාශ වූ අතර, මෙම රථයෙහි ලියාපදිංචි සහතිකය මේ වන විට අත්තනගල්ල මහාධිකරණයේ නඩු භාණ්ඩයක් ලෙස රඳවා ගනිමින් කැබ් රථය බැඳුම්කරයකට යටත්ව මීගහකිවුල සභා ලේකම් නමට නිදහස් කර ඇත. (නඩු අංක - B1072/22).<br>එමෙන්ම, රථයෙහි ලියාපදිංචි සහතිකයෙහි මුල් පිටපත රක්ෂණ ආයතනය වෙත ලබාදීමෙන් පසු මුළු රක්ෂණ හිමිකම් මුදල පියවීමට රක්ෂණ ආයතනය එකඟවී ඇති අතර (රක්ෂණ හිමිකම් අංක V/CH/1/010/1035842/2022), මේ වනවිට මුළු හිමිකම් මුදල ලබා ගැනීමට අදාළ නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 714 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදුවී තිබුණු මුදල් වංචාව සඳහා වර්ෂ 10 කට අධික කාලයක් ගතවී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නිරවුල් නොකළ ශේෂය රු. 440,990 ක් විය. | මුදල් අතුරුදහන් වීම සිදු වී වසර 21 ක් ගතව ඇතත් අදාළ ශේෂය තව දුරටත් පවතිනුයේ ඒ සම්බන්ධ මූලික විමර්ෂණයේදී වගකිව යුත්තන් කවුරුන්දැයි නිශ්චය කර දැනුම් දී නොමැති බැවිනි. මේ සම්බන්ධයෙන් පැවැති අධිකරණ නඩු තීන්දුවෙන් එවකට බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් සම්බන්ධයෙන් කටයුතු කළ ප්‍රධාන ලිපිකරු ඒ.එම්. ලීලාවතී මිය නිදොස් කොට නිදහස් කර ඇත. ඇය 2021 ජූලි 07 දින මිය ගොස් ඇති බවත් මේ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා මෙම මුදල කපා හැරීම පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටුව මගින් ඉදිරි කටයුතු සිදු කරමි. | පළාත් මූල්‍ය රීති 104 අනුව පරීක්ෂණ සිදුකර නිරවුල් නොවූ ශේෂය වගකිව යුතු නිලධාරීන්ගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (Out Come) ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | "සෞභාග්‍ය දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව නිරෝගි හා ඵලදායී පුරවැසියන් බිහි කිරීමේ අරමුණින් වස විසෙන් තොර ආහාර ලබා දීමේ සංකල්පයට අනුව රසායනික පොහොර, රසායනික පළිබෝධනාශක හා රසායනික වල් නාශක වලින් තොරව වගාකිරීමට හැකිවනු පිණිස සමස්ථ කෘෂිකර්මාන්තය සඳහා කාබනික පොහොර හා වෙනත් කාබනික යෙදවුම් පළාත් මට්ටමින් නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම උදෙසා ඌව පළාත් සභාව විසින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන රු.මි.70.7 ක්ද, පළාත් විෂය නිශ්චිත ප්‍රතිපාදන (PSDG) රු.මි. 21.24 ක්ද, ලෙස එකතුව රු.මි. 91.94 ක් වැය කර තිබුණ ද, 2024 මාර්තු 15 දින වන විට වැඩසටහන ක්‍රියාත්මක වීම මුළුමනින්ම නතර කර තිබුණි. ඒ අනුව එම වැඩ සටහන වෙනුවෙන් වැයකර තිබුණු රු.මි.91.94 ක් වූ මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණු බව පහත කරුණු අනුව සනාථ විය. | | |
| **(i)** | කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා රු. 15,000 කට යටත්ව මූල්‍යාධාර මුදලක් ඇතුළත් පැකේජයක් ලබාදීම සැලසුම් කර මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 1686 ක් සහ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 2268 ක් සඳහා පැකේජයේ ද්‍රව්‍යමය අධාර පමණක් ලබාදී එප්පාවල රොක් පොස්පේට් කිලෝග්‍රෑම් 800,000 ක් ලබානොදීම හේතුවෙන් අපේක්ෂිත පොස්පේට් සහිත කාබනික පොහොර මෙට්‍රික්ටොන් 26,000 නිෂ්පාදනය සිදු කිරීමට අපොහොසත් වි තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය වැයකර තිබුණු රු.32,350,920 ක වියදම මුළුමනින්ම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | පැකේජය ලබා දුන් කාලයේ සිට සෙසු ද්‍රව්‍යමය ආධාර භාවිතා කර සැලකිය යුතු ප්‍රමාණයක් කාබනික පොහොර නිෂ්පාදනය කර ඇති අතර දැනටමත් එම පැකේජය උපයෝගි කර ගෙන කාබනික පොහොර නිෂ්පාදනය කරගෙන යාම සිදු වෙයි. එම කාබනික පොහොර ගෙවතු හා සුළු පරිමාණ වගාවන් සඳහා භාවිතා කෙරේ. එම නිසා ද්‍රව්‍යමය ආධාර ලබා දීම තුළින් ගෘහස්ථ මට්ටමින් කාබනික පොහොර ප්‍රචලිත වූ අතර එය නිශ්කාර්ය වියදමක් නොවන බව සඳහන් කරමි. | ගුණාත්මක කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට පියවර ගත යුතුය. |
| **(ii)** | කාබනික පොහොර නිපදවා ගැනීමට අවශ්‍ය කොම්පෝස්ට් ප්‍රමාණයෙන් සියයට 50 ක් පළාත තුළම නිෂ්පාදනය කර ගැනීම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වුවද ඊට අනුකූල නොවන ලෙස රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීමට රු. 6,876,540 ක් ද , පළතුරු පැල මිලදී ගැනීමට රු.10,768,850 ක් ද මඤ්ඤොක්කා දඬු සිටුවීම සඳහා ප්‍රතිලාභීන් 66 දෙනෙකු සඳහා රු.1,780,000 ක මුදල ක් ද බිබිල දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය සහ බිඳුණුවැව සේවා සංස්කරණ ආයතනයෙහි වගාවන් ස්ථාපිත කිරිම හා ස්ථිර නාම පුවරු මිලදී ගැනීමට | 2021 නොවැම්බර් 21 වන දිනට නව ක්‍රියාකාරකම් සහිත සංශෝධන සැලැස්ම අනුව කටයුතු කළ අතර, එහි අරමුණු කිහිපයක් අතරින් ඒකාබද්ධ ශාඛ පෝෂක කළමනාකරණය භාවිතා කරමින් පළතුරු හා වෙනත් වගා ප්‍රවර්ධනයත්, දොඩම් ආනයනය සීමා කර ඇති පසුබිමක දොඩම් ඇතුළු පැඟිරි වගා ප්‍රවර්ධනය ඉහළ නැංවීමත්, කාබනික පොහොර යොදා පාංශු සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවමින් | අපේක්ෂිත අරමුණු කරා යොමුවීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු. 1,798,250 ක්ද ගෙවා තිබීම නිසා වැයකර තිබුණු සමස්ථ වියදමින් සියයට 23 ක ප්‍රතිශතයක් අරමුණට අනුකූල නොවන ලෙස වැයකර තිබුණි. | දේශීය අල බෝග වගා ප්‍රවර්ධනය කිරීමත් අරමුණු ඇතිව රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කර ඇත. | |

**(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුරකරුවන් දෙදෙනෙකුගේ අතිරික්තයක් පැවතියදීත් 2011 සිට 2016 දක්වා වර්ෂ තුළ අනියම් පදනමින් බඳවාගත් මුරකරුවන් 05 දෙනෙකුට එම කාලය තුළ වැටුප් වශයෙන් රු. 15,004,048 ක්ද අතිකාල හා නිවාඩු දින රාජකාරී කිරීම වෙනුවෙන් වැටුප් වශයෙන් රු. 60,116 ක්ද ගෙවා තිබුණි. | 2011 සහ 2016 දක්වා වර්ෂ තුළ අනියම් පදනමින් බඳවාගත් මුරකරුවන් 05 දෙනා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුබද්ධ ආයතන වලට අනුයුක්තව සේවය කර ඇති අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනියම් මුරකරු තනතුරට පත්කර අනුමත කර ඇත. එම කාල සීමාව තුළ ප්‍රමාණවත් සේවකයින් සංඛ්‍යාවක් සිට නොමැති නිසා භෞතික සම්පත් හා මානව සම්පත්වල ආරක්ෂාව නිසි පරිදි පවත්වා ගැනීමට සේවා මුර ක්‍රමය යටතේ මුරකරුවන් මෙම ආයතන වෙත ලබාගෙන ඇත. | අතිරික්ත සේවකයින් සේවයේ යොදවාගෙන ඌන සේවකයින් විධිමත් පරිදි බඳවා ගැනීමට පියවර ගත යුතුය. |

## 1.5.13 ශීර්ෂය 715 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**(අ) අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **ආයතන සංග්‍රහය**<br>ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.6 ඡේදය | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිවාස 28 ක පදිංචිකරුවන්ගෙන් අවිධිමත්ව ආර්ථික කුලිය අයකිරීම හේතුවෙන් පළාත් සභාවට රු.2,962,571ක කුලී ආදායමක් අහිමි වී තිබුණි. | වසර 03 ඉක්මවා ඇති සියලුම නිල නිවාස තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. අදාළ වාර්තා පදනම් කරගෙන එක් එක් නිලධාරීන්ගේ නිවාස කුලිය අයවීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5.6 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

**(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 5.2.5(අ)(ii) ඡේදයට අනුකූල නොවන ලෙස නිලධාරීන් 43 ක් වසර 05 ත් 22 ත් අතර දීර්ඝ කාලයක් ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හා එම දෙපාර්තමේන්තු යටතේ තිබෙන ආයතන වල සේවයේ නිරත වී තිබුණි. | පිළිතුරු ලැබී නැත. | ඌව පළාත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 5.2.5(අ)(ii) ඡේදයට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 716 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**(අ) ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් දීර්ඝ කාලීනව බදුදීම වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වාණිජ පදනමින් බදුකර ලෙස ලබාදී තිබුණු දීර්ඝකාලීන බදු බලපත්‍ර 122 කට අයත් බදුකරුවන් 122 කගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 139,242,705 ක හිඟ බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | බදුකරුවන් 122 දෙදෙනෙකු සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් බදු ගෙවන ලෙසට දැන්වීම් කර ඇති අතර, බදු ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට බලතල මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරි පියවර ගැනීම සඳහා දන්වා යවා ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 718 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 1991 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ රෙදිපිළි ණයට විකුණුම් වෙනුවෙන් අයවිය යුතු එකතුව රු. 2,255,817 ක හිඟ ණය ශේෂයන් වසර 20 කට අධික කාලයක සිට අයකර ගැනීමට කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් රෙදිපිළි ණය පදනම මත අලෙවි කරනු ලබන්නේ රජයේ නිලධාරීන්ට පමණක් වන අතර බාහිර පාර්ශවයන්ට අත්පිට මුදලට පමණක් අලෙවි කරනු ලබයි. ණය පදනමින් සිදු කරන අලෙවි සඳහා ණය | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වාරික වශයෙන් අයකරන බැවින් මෙම හිඟ ණය ශේෂය ගිණුම් තැබීමේ දෝෂයක් හේතුවෙන් සිදුවී ඇත. සත්‍ය වශයෙන් මෙවැනි ණය ශේෂයක් නොමැත. ඉදිරියේදි එම ණය ශේෂයන් කපා හැරීමට කටයුතු කෙරේ. | |

**(ආ) දෘෂ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2004 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී වැටුප් ගෙවීමට අදාළ වවුචර්පත් නියැදි පරීක්ෂාවකට භාජනය කළ අතර එහිදී අදාළ කාර්මිකාවන් විසින් ඉදිරිපත් කළ ප්‍රකාශ අනුව රිල්පොල පේෂකර්ම මධ්‍යස්ථානයේ කාර්මිකාවන් 05 කට උක්ත කාල පරිච්ඡේදය තුළ දී හිමි විය යුතුව තිබූ රු.777,606 ක් වූ වැටුප් එවකට ස්ථාන භාර නිළධාරී විසින් ව්‍යාජ අත්සන් යොදා ලබාගෙන තිබුණි. | කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කරමි. | වගකිවයුතු හා නොසැලකිලිමත්ව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**(ඇ) බැංකු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් වාණිජ බැංකුවක පවත්වා තිබුණු ජංගම බැංකු ගිණුමට අදාළව 2023 ඔක්තෝබර් මාසය සඳහා පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව දක්වා තිබුණු රු. 3,386,380 ක සෘජු බැර බැංකුවෙන් විමසා හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙම ශේෂයෙන් රු. 1,689,994 ක ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. බැංකු ගිණුම් කිහිපයක් පවතින බැවින් එම ගිණුම් අතර මාරුවීම් සිදුවන බැවින් මෙම දෝෂයන් සිදුව ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | සෘජු බැර බැංකුවෙන් විමසා හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 722 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**(අ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වැලිමඩ ,මහියංගණය සහ වැල්ලවාය යන පරිවාස කාර්යාල 03 සඳහා නිශ්චිත ගොඩනැගිලි ඉදිකර ගැනීමට කටයුතු නොකර මාසික කුළි පදනම මත වර්ෂ 05 සිට 11 දක්වා කාලයක් තුළ පවත්වාගෙන යන අතර කුලිය වශයෙන් 2023 අගෝස්තු වන විට | මහියංගන පරිවාස කාර්යාලයේ ඉදිකිරීම් කර්මාන්තය නිම කරන තෙක් තාවකාලික ගොඩනැගිල්ලක් වෙන්කර ගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතින අතර, වැලිමඩ පරිවාස කාර්යාලය ස්ථානගත කිරීම සඳහා වැලිමඩ පැරණි අධිකරණ ගොඩනැගිල්ලෙන් ස්ථානයක් | රජයේ ගොඩනැගිලි වල පරිවාස කාර්යාල ස්ථාපිත කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| පෞද්ගලික අංශයට ගෙවා තිබුණු මුදල රු.5,059,500 ක් විය. | වෙන්කර ගැනීමට කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, වැල්ලවාය පරිවාස කාර්යාලය පවත්වාගන යාම සඳහා සුදුසු ස්ථානයක් ලැබුණු පසුව පරිවාස කාර්යාලය ස්ථානගත කිරීමට කටයුතු කරමි. | |

### 1.5.17 ශීර්ෂය 726 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

**(අ) මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ ආදායමට ගතයුතු රු. 6,236,856 ක අතරුදවුම් තැන්පත් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු නොකර තැන්පත් නිදහස් කිරීමක් හා නැවත ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | දැනට කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳව විමර්ශනය කොට ඉතා කඩිනමින් කල් ඉකුත් වූ තැන්පත් උපරිම අයුරින් නියාදනය කිරීමට පියවර ගන්නා බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු හඳුනාගෙන සුදුසු පියවර ගත යුතුය. |

**(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ප්‍රමාද වූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම රු. 73,177,786 ක් වූ මහියංගනය පරිවාස ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි වැඩ 2022 නොවැම්බර් 28 දිනට අවසන් කිරීමට නියමිතව පැවතියද 2024 ජනවාරි 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය සියයට 50 මට්ටමක පැවතුණි. එදිනට නිමකර තිබූ වැඩ කොටස් සඳහා මිල විචලනය ද ඇතුලුව රු. 46,537,466 ක් ගෙවීම් කර තිබූ අතර එය ගිවිසුම්ගත කොන්ත්‍රාත් වටිනාකම වූ රු. 54,902,042 න් සියයට 85 ක් විය.<br><br>ඒ අනුව මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික කාර්ය සාධනයක් අත්පත් කරගෙන නොතිබුණු අතර කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් රු. 11,665,882 ක කාර්යයන් මුළුමනින්ම ඉටුනොකර කර්මාන්තයෙන් කොන්ත්‍රාත්කරු ඉවත් වී තිබුණි. කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර කර්මාන්තයේ ගිවිසුම අවලංගු කර නැවත | ඉදිකිරීම් සිදුකරගෙන යන අතරතුර, සිදු වූ අත්තිවාරමේ වෙනසකම් සඳහා අනුමැතිය ලබා ගැනීම, 2021 වර්ෂයේ දැඩිව පැවති කොවිඩ් වසංගත අර්බුදය, හා විශේෂයෙන් 2022 වර්ෂයේ රටේ ඇති වූ තත්ත්වයන් මත සිදුවූ ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපාංග ඇතුළු අනෙකුත් සියලු ද්‍රව්‍ය වල මිල අසීමිතව ඉහළ යාම හා ඒ ඒ වර්ෂයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල සීමා සහිත වීම 2022 නොවැම්බර් 28 දිනට ඉදිකිරීම් නිම කිරීමට නොහැකි වීමට බලපා ඇත.<br><br>ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් ගිවිසුම් අවලංගු කර නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමෙන් මේ සඳහා වෙනම පිරිවැයක් දැරීමට හේතුවන බැවින් කිහිප අවස්ථාවකදීම කොන්ත්‍රාත් ආයතනය සමග සාකච්ඡා කර එම ආයතනය වෙතින්ම ඉදිකිරීම් නිම කරවා ගැනීමට | ඉදිකිරීම් නියමිත කාල සීමාව තුළ නිම කිරීමට පියවර ගත යුතු අතර නොසැලකිල්ල නිසා සිදුවන ප්‍රමාදයන්හි අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. | උත්සහ කළ අතර, කොන්ත්‍රාත් ආයතනය එකඟ වූ පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් මේ වන විට එම කර්මාන්තයේ ගිවිසුම අවලංගුකර නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකර නව කොන්ත්‍රාත් ආයතනයක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ලංසු ඇගයීම් කටයුතු සිදුකරමින් පවතී. | |

**1.5.18 ශීර්ෂය 731 - මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වාහනයකට සිදුවී තිබූ අනතුර සම්බන්ධයෙන් අයකරගත යුතු අලාභය රු. 703,600 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වගකිව යුතු පාර්ශවයෙන් අයකරගෙන නොතිබුණි. | අංක 54-1355 දරන වාහනයේ අනතුර සම්බන්ධයෙන් පළාත් යාන්ත්‍රික කාර්යාලය විසින් දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව අනුව වාහන අනතුර හේතුවෙන් සිදු කළ යුතු අලුත්වැඩියාවන් සඳහා රු. 703,600 ක මුදලක් අලාභය වශයෙන් අය කර ගත යුතුව ඇත. එම වාහනය මේ වන විට අලුත්වැඩියාව සඳහා යොමු කර ඇත. | අලාභයේ වටිනාකම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.19 ශීර්ෂය 736 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය**

**(අ) අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි**<br>571 | 2023 දෙසැම්බර් 31 දිනට ආයතන 14 කට අදාළ වර්ෂ 02 ඉක්ම වූ නියාදනය නොකළ රු.1,805,909ක පොදු තැන්පත් ශේෂයක් විය. | වටිනාකම රු. 1,805,909 ක්වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කරනු ඇත. | කල් ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි වලට අනුකූලව නියාදනය කළ යුතුය. |

**(ආ) ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් වල මුළු ශුද්ධ හිඟ මුදල රු. 155,866,800 ක් වූ අතර එම හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | ඉඩම් හිඟ බදු සම්බන්ධව අදාළ හිඟ මුදල් නොගෙවීම හේතුවෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා කිහිප අවස්ථාවකදීම ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලිපි මගින් දැනුවත් කරන ලදී. පළාත් සභාවලට නීතිමය කටයුතු කිරීමට බලතල නොමැති බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/06 හා 2021 ඔක්තෝබර් 13 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව හිඟ බදු නොගෙවන බදුකරුවන්ගේ බදුකර අවලංගු කර නීතිමය කටයුතු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව කටයුතු කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ සමාංක UPLC/D/4/පොදු හා 2021 ඔක්තෝබර් 18 දිනැති ලිපිය මගින් සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බව සඳහන් කරමි.<br><br>**දේපළ පැවරීම මත මුද්දර බදු**<br><br>සාධන පත්‍ර සඳහා නිවැරදි වටිනාකම මත මුද්දර ගාස්තු අය කර ගෙන නොමැති අවස්ථාවලදී අඩු වටිනාකම් සහිතව ලියා ඇති ඔප්පු පරීක්ෂා කර එම පුද්ගලයන් සඳහා අදාළ හිඟ මුදල් ගෙවීමට කාලය ලබා දේ. එසේ ගෙවීම් ක්‍රියාවලියක් සිදු වන අතර ගෙවීම් සිදු නොකරන පුද්ගලයන් වෙනුවෙන් අධිකරණ ක්‍රියා මාර්ග ගෙන එම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. මෙම කටයුතු වාර්ෂිකව අඛණ්ඩව සිදු වන ක්‍රියාවලියක් බව සඳහන් කරමි.<br><br>**රා තැබැරුම් රේන්ද /විවිධ ලැබීම්**<br><br>මේ පිළිබඳව නිරන්තර දැනුවත් කිරීම් සිදු කර ඇත. එමෙන්ම මෙම පුද්ගලයින් මේ වන විටත් සොයා ගත නොහැකිව ඇත. එබැවින් නීතිමය ක්‍රියා මාර්ග ගැනීම හෝ එහි ඵලදායීතාවයක් නොමැති නම් නෛතික ප්‍රතිපාදනයන්ට අනුව අදාළ මුදල කපා හැරීම සඳහා කටයුතු කෙරේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) අනෙකුත් අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාලවලින් බැහැරට ස්ථාන මාරුවී ගිය, නිලධාරීන්ගෙන් රු. 36,203,255 ක ශේෂයක් හා මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය වෙනත් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 22,378,751 ක් වූ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ)(ආ)(ඉ) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය තුළ වැඩි මුදලක් පවතින්නේ වෙනත් පළාත් සභා හා මධ්‍යම රජයට ගිය නිලධාරීන්ගේ ණය ශේෂ වේ. එම ශේෂ අයකර ගැනීමට අන්තර් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන දැනුවත් කර සාකච්ඡා කර ඇති අතර එම ශේෂ ක්‍රමිකව පියවෙමින් පවතී. එමෙන්ම පළාත් සභා නිලධාරීන් මාරු වී යන අවස්ථා වලදීම මුළු ණය ශේෂයම එකවර අයකර ගැනීමට කටයුතු කිරීමට සියලුම ආයතන වලට දන්වා ඇත. විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් පියවා ගැනීමට අදාළව කටයුතු සිදුකර ඇති නමුත් එම දෙපාර්තමේන්තුවේ පවතින ද්‍රවශීලතා ගැටළු නිසා ණය පියවීම ප්‍රමාද වී ඇත. මියගිය හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පියවා ගැනීමට අදාළ උපදෙස් අදාළ ආයතව වලට ලබාදී ඇත. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ)(ආ)(ඉ) විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**(ඈ) නිරවුල් කළයුතු ණය ශේෂ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 07 කින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 31,104,029 ක් වූ ණය ශේෂය නිරවුල් කර නොතිබුණි. | වෙනත් පළාත් සභා මධ්‍යම රජය හා පළාත් පාලන ආයතන වලින් පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් මේ තුළ අන්තර්ගත වේ. මෙම ශේෂයන් මේ වන විට ක්‍රමිකව නිරවුල් වෙමින් පවතී. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට ආයතන 10 කට අදාළ රු. 13,221,469 ක හඳුනා නොගත් ණයහිමි ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. උක්ත ශේෂයෙහි ඇතුළත් රු. 13,112,693 ක් ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිරවුල් නොකරන ලද දිගුකාලයක සිට පැවත එන ණය ශේෂයක් වන අතර ඊට අදාළව නිලධාරීන් පිළිබඳ විස්තර හා | පළාත් සභා පිහිටුවීමේ ආරම්භක අවධියේදී මධ්‍යම රජයේ ගුරුවරුන් පළාත් සභාවට අන්තර්ග්‍රහණය කිරීමේදී ආරම්භක වර්ෂ කිහිපයකදී එම නිලධාරීන්ගේ ණය ශේෂ පළාත් සභාවට අයවීම සිදුව ඇත. එම ණය ශේෂ පළාත් සභාව විසින් රේඛීය අමාත්‍යාංශය වෙත නිරවුල් කිරීමක් සිදු කර නොමැති අතර එම ණය ශේෂ මහා භාණ්ඩාගාරය වෙත පවරා ගැනීම සිදු කර ඇත. ඒ අනුව, | ණය ශේෂය හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාල විශ්ලේෂණය ආදී විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් එම ශේෂය පිළිබඳ සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ගිණුම් වසා තැබීම හේතුවෙන් ආරම්භයේදී මෙම ණය ශේෂයන් මහා භාණ්ඩාගාරය වෙත නිරවුල් කර ඇත. අන්තර්ග්‍රහණයන්ට අදාළව මහා භාණ්ඩාගාරයේ ගිණුම් තැබීම අවසන්ව ඇති බැවින් මෙම ණය ශේෂයන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් සභා අතර නිරවුල් කළ යුතු ණය ශේෂ නිරවුල් කර ගැනීමෙන් අනතුරුව පළාත් සභාවේ ආදායමක් වශයෙන් ගිණුම් තැබීමට සටහන් කර ගෙන කටයුතු කරනු ලැබේ. | |
| **(iii)** | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ ණය සටහන් අංක 10 හි ආයතන 04 කට "වෙනත්" නැමති ශීර්ෂ යටතේ ඉදිරිපත් කර තිබූ රු. 2,369,847 ක් වූ අයවිය යුතු ණය ශේෂය නිශ්චිතව හඳුනාගත හැකි අයුරින් වෙන වෙනම ණය වර්ග අනුව බෙදා එම ආයතනවල විසර්ජන ගිණුමේ 3.8 ඇමුණුමේ හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් එකී ණය ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අධ්‍යාපන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ දේශීය නිවාඩු ලබා සිටින නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂයන් පිළිබඳ විස්තර අත්තිකාරම් බී ගිණුමේ ඇමුණුම් 3.8 හි දක්වා ඇති අතර එම ණය ශේෂයන් අයවෙමින් පවතී. අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළව පවත්නා රු. 1,981,060 ක හා රු.117,757 ක ණය ශේෂයන් හඳුනා ගනිමින් පවතී. | ණය ශේෂය හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.20 ශීර්ෂය 738 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය**

**(අ) අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| **(i)** | අංක 26/92 හා 1992 අගෝස්තු 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | රජයේ වාහන පුද්ගලික පාවිච්චිය සඳහා යොදා ගැනීමට හිමිකම් ඇති රජයේ සහ රාජ්‍ය /සංස්ථා නිලධාරීන් සඳහා වෙන්කොට ඇති වාහන සම්බන්ධයෙන් හැර අනෙකුත් සියළුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු අතර ඌව පළාත් සභාවේ ආයතන 23 කට අයත් වාහන 98ක රාජ්‍ය ලාංඡනය යෙදීමට | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | අමතරව ආයතනයේ නම වාහන බඳෙහි සටහන් කර නොතිබුණි. | | |
| **(ii)** | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ඌව පළාත් සභාවේ ආයතන 21 කට අයත් වාහන 135 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහන පරීක්ෂාව නිසි ලෙස සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(i)** | ගර්හිත වාහන, අපහරණයේදී වාහන දෙකක් පෞද්ගලික ගැණුම්කරුවන් විසින් 2019 ජනවාරි 04 දින මිලදී ගෙන තිබුණ ද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව 2023 සැප්තැම්බර් 13 දින වන විටත් ඌව පළාත් ප්‍රධාන ලේකම් හා ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් ලියාපදිංචිය පැවතිණි. | ධාවනයට නුසුදුසු තත්ත්වයේ පැවති බැවින් වාහනයක් වශයෙන් අපහරණය සිදු වී ඇති අතර පෞද්ගලික පාර්ශවයන් සඳහා මුල් ලියාපදිංචි සහතිකය ලබා දී ඇත. ටෙන්ඩර් මාර්ගයෙන් ලබා ගන්නා වාහන අලුත්වැඩියාවන් සිදු කර ධාවනයේ යෙදවීමට අවශ්‍ය යෝග්‍යතා සහතික, දුම් සහතික හා ආදායම් බලපත්‍ර ගැනීමෙන් පසු ධාවනයට යෙදවීමට කාලයක් ගතවන බව බොහෝවිට නිරීක්ෂණය වන කරුණකි. වාහන ලියාපදිංචිය වෙනස් වනතුරු වාහනයේ වර්තමාන අයිතිය වෙනස් නොවී පවතී. මෙම වාහනයේ ලියාපදිංචිය වෙනස්වීමෙන් පසු ටෙන්ඩරයෙන් පැවරුම් කළ දිනයේ සිට අදාළ සම්පූර්ණ කාල සීමාව වෙනුවෙන්ම හිඟ ආදායම් ලබා ගෙන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු සිදු වේ. | වාහන අපහරණය කිරීමෙන් පසු අයිතිය බැහැර කිරීම පිළිබඳ පසු විපරම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | 2019 ජනවාරි 04 දින අබලි ද්‍රව්‍ය ලෙස අලෙවි කළ ඌව පළාත් සභාවට අයත් ගර්හිත තත්ත්වයේ පැවති වාහන 18 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව 2023 සැප්තැම්බර් 13 දින වන විටත් රජය නමින් ලියාපදිංචිය පැවතුණි. | මේ පිළිබඳව අදාළ කාල වලදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කිරීම සිදු කර ඇත. එමෙන්ම වර්තමානයේදී රජයේ ගිණුම්කාරක සභාව විසින් ලබා දුන් නියෝග අනුව කරන ලද ඉල්ලීම් වලට අනුව පසුගිය වසර 10 තුළ රජයෙන් වෙන්දේසි කළ හා අබලි ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක් ද පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඒ අනුව, මෝටර් රථ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය යාවත්කාලීන වීමට අදාළ තොරතුරු ලබා දී ඇත. | වාහන අපහරණය කිරීමෙන් පසු ආයතන අතර සම්බන්ධීකරණය ක් තුළින් වාහන දත්ත පද්ධතිය යාවත්කාලීන කර ගත යුතුය. |
| **(ඇ)** | **වත්කම් කළමනාකරණය** | | |
| | **නඩත්තු හා අලුත්වැඩියා සිදුනොකිරීම** | | |
| | අලුත්වැඩියා කටයුතු සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත භාරදී තිබූ ඌව පළාත් සභාවේ ආයතන 03 කට අයත් වාහන 04 ක් විගණිත දින වූ 2023 අගෝස්තු 09 දිනටත් අදාළ කාර්යයන් ඉටුනොකර පළාත් යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ කාර්යාලයේ එළිමහන් පරිශ්‍රයේ ගාල් කර තිබුණු අතර ආයතන 03 ක් සතු වාහන 04 ක් අලුත්වැඩියා කටයුතු සඳහා පළාත් සභා නඩත්තු ඒකකය වෙත භාරදී මාස 04 සිට මාස 44 දක්වා කාලයක් ගතවී තිබුණ ද අදාළ අලුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. | **PA-8631 දරන වාහනය**<br><br>අමතර කොටස් ලැබී නොමැති බැවින් අදාළ අමතර කොටස් ලබා දුන් පසු අලුත්වැඩියාවන් නිමකිරීමට සැලසුම් කර ඇත.<br><br>**LW-0222 දරන වාහනය**<br><br>මෙම වාහනය එම ආයතනය විසින් ඉන්ජෙක්ටර් පොම්පයේ අලුත්වැඩියාව සඳහා බාහිර පෞද්ගලික ආයතනයක් වෙත යොමු කර වසර කිහිපයක් ගත වී ඇති නමුත්,<br>අලුත්වැඩියාවන් අවසන් කිරීමට නොහැකිව තිබිය දී එම ආයතනයේ ඉල්ලීම පරිදි මෙම ආයතන පරිශ්‍රය වෙත ගෙන එන ලද නමුත් අලුත්වැඩියාව සඳහා අදාළ පෞද්ගලික ආයතනය විසින් ගලවන ලද ඉන්ජෙක්ටර් 04 මේ වන තෙක් විධිමත් පරිදි භාරදී නොමැති බැවින්, ඒවා ලද වහාම අලුත්වැඩියාවන් | වාහන කාලීනව අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නිම කිරීමට සැලසුම් කර ඇත.<br><br>**18-5365 දරන වාහනය**<br><br>අමතර කොටස් සොයාගැනීමේ දුෂ්කරතාව හේතුවෙන් අලුත්වැඩියාව ප්‍රමාද විය.<br><br>**31-1135 දරන වාහනය**<br><br>මෙම වාහනය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් භාර දී නොමැත.<br><br>**56-7780,40-8504, 252-4236, LW-0252 දරන වාහන**<br><br>අලුත්වැඩියාවන් සිදු කරමින් පවතී. | |

**(ඇ)** **වාහන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඌව පළාත් සභාවට අයත් ආයතන 04 ක් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන 12 ක සහ යතුරුපැදි 04 ක භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | **80- 9282 , 36-0136, 71-4458, 42-0319, 42-2182, 42-4236 හා GB 4823 දරන වාහන**<br><br>ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති හෙයින් මෙම වාහනය භාවිතයක් සිදුව නැති බවත් නිෂ්පාදන වර්ෂයන් අනුව මීට වසර 10 කට පෙර කාලය තුළ මෙම වාහනය අපහරණයන්ට යොමුවී තිබිය හැකි අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු යාවත්කාලීන වී නොතිබිය හැකිය. | අදාළ වාහන හා යතුරු පැදිවල භෞතික පැවැත්ම හෝ අපහරණය කිරීම් විස්තර සනාථ කිරීමට අදාළ සාක්ෂි විගණනයට වාර්තා කළ යුතුය. |

**53-5063 දරන වාහන**

53-5060 සිට 53-5080 දක්වා සියලුම වාහන පැවතී ඇත්තේ පළාත් පාලන ආයතනවලට 1993 වර්ෂයන්හිදී සභාවන් වෙත ලබා දී ඇත. මෙම වාහනය හැරුණු විට අනෙකුත් සියලුම වාහන 2012 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදී අපහරණය කර ඇත. පසුගිය කාල සීමාව තුළ පැවති යුදමය කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පළාත් සභාවල පැවති මෙම වාහන යොදවා ගෙන ඇති අතර එම වාහන නැවත ලබා දීමේදී අබලන් තත්ත්වයෙන් පැවති බැවින් එම වාහන විකිණීමට කටයුතු කර ඇත. මෙම වාහනයේ ලියාපදිංචි සහතිකය කාර්යාලයේ පැවතිය ද වාහනය නැවත භාර දීමක් සිදු කර නොමැත. එබැවින් එම කාලය තුළ වාහනය විනාශ වීමක් සිදු වී ඇතැයි නිරීක්ෂණය වේ.

**GG- 3905, XZ-9423 හා XZ-9439 දරන වාහන**

ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත පරිගණක පද්ධතියට ඇතුළත් කිරීම සඳහා දැනුවත් කර ඇත.

**HK-5808, RW 0501 හා SP 1349 දරන වාහන**

පැවරුම වෙනස් කිරීම සඳහා දැනුවත් කිරීමට සටහන් තබා ගෙන ඇත.

**17-1012, 16-7667**

වසර 10 කට පෙර කාලය තුළ මෙම වාහන අපහරණයට ලක්ව ඇති අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු යාවත්කාලීන වී නොතිබිය හැකිය.

1.5.21 **ශීර්ෂය 739 - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව**

**(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 11 දිනැති අංක UV/FCR/2017/II/VOI-II දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සමාලෝචන ලිපිය අනුව දෙපාර්තමේන්තුගත තනතුරක් ලෙස (MN4) අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරු 18 ක් අනුමත වී 2023 ඔක්තෝබර් වන විට වසර 05 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව එම තනතුරු 18 සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටීන් හා සේවා ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි. 2020 වර්ෂයේදී වර්ෂ 05 ක කාලයක් සඳහා සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 17 ක් හා කළමනාකරණ සේවයේ නිලධාරීන් 02 ක් වශයෙන් නිලධාරීන් 19 ක් බඳවා ගෙන තිබුණි. | විගණන නිලධාරීන් සඳහා බඳවාගැනීමේ පටිපාටියක් මේ වනවිට කෙටුම්පත් කර ඇත. 2013 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව අනුමතව පවතින විගණන නිලධාරී තනතුරු 18 සඳහා ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 18 දින නිලධාරීන් 18 දෙනෙකු පත්කර ඇත. | අභ්‍යන්තර විගණන සේවය සඳහා බඳවා ගැනීමේ පටිපාටීන් හා සේවා ව්‍යවස්ථාවක් සකස් කර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

**(අ) මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,943,894,498ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,328,737,256 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු. 384,842,758 ක් විය.

**(ආ) ආදායම් හා වියදම් විචලනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ආදායම | | |
|---|---|---|---|
| | **2023** | **2022** | විචලනය |
| | තථ්‍ය රු. | තථ්‍ය රු. | රු. |
| **පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්** | | | |
| බදු ආදායම | 1,880,523,416 | 1,583,187,067 | 297,336,349 |
| බදු නොවන ආදායම | 737,383,636 | 670,373,795 | 67,009,841 |
| රජයේ ප්‍රදාන | 33,203,977,046 | 28,518,761,554 | 4,685,215,492 |

| | | | |
|---|---|---|---|
| | -------------------- | -------------------- | ------------------- |
| එකතුව | 35,821,884,098 | 30,772,322,416 | 5,049,561,682 |
| | ============ | ============ | =========== |

**වියදම**

| | **2023** | **2022** | **විචලනය** |
|---|---|---|---|
| | තථ්‍ය | තථ්‍ය | |
| | රු. | රු. | රු. |
| **පුනරාවර්තන වියදම්** | | | |
| පෞද්ගලික පඩිනඩි | 26,346,038,860 | 23,781,726,765 | 2,564,312,095 |
| අනෙකුත් පුනරාවර්තන | 11,380,202,817 | 9,601,454,352 | 1,778,748,465 |
| උප එකතුව | 37,726,241,677 | 33,383,181,117 | 4,343,060,560 |
| | ============ | ============ | =========== |
| පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම | 1,039,536,919 | 717,878,555 | 321,658,364 |
| | -------------------- | ------------------- | ------------------ |
| එකතුව | 38,765,778,596 | 34,101,059,672 | 4,664,718,924 |
| | ============ | ============ | ========== |
| අතිරික්තය/(ඌනතාවය) | **(2,943,894,498)** | **(3,328,737,256)** | **(384,842,758)** |

| | |
|---|---|
| - පුනරාවර්තන ස්වභාවයේ සංවර්ධන වියදම | 1,039,536,919 |
| - ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු ලබන ප්‍රාග්ධනිත කරනු ලබන වියදම්. | 1,646,270,527 |
| | ------------------- |
| රාජ්‍ය ආයෝජන | **2,685,807,446** |
| | ========== |

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. 35,821,884,098 ක් වූ අතර ඉන් රු. 33,203,977,046 ක් රජයේ ප්‍රදාන විය. බදු ආදායම රු. 1,880,523,416 ක් එනම් මුළු ආදායමෙන් සියයට 5 ක් ද බදු නොවන ආදායම රු.737,383,636 ක් එනම් මුළු ආදායමෙන් සියයට 2 ක්ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු.35,821,884,098 න් පුනරාවර්තන වියදම් සඳහා (ක්ෂය හැර) රු. 32,941,875,483 ක් එනම් සියයට 92ක්ද රජයේ ආයෝජන සඳහා රු. 2,685,807,446 ක් එනම් සියයට 08 ක් ද උපයෝජනය කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූලාශ්‍රය | අනුමත මුදල | වැය කළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උපමාන පාදක ප්‍රදාන | 369,000,000 | 202,110,494 | 166,889,506 |
| පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2,093,000,000 | 857,712,481 | 1,235,287,519 |
| ලෝක බැංකු ආධාර | | | |
| - විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන(අධ්‍යාපන) | 447,247,354 | 380,737,783 | 66,509,571 |
| - විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 1,445,000,000 | 1,423,332,165 | 21,667,835 |
| - වෙනත් - UNDP | 81,909,323 | 76,939,068 | 4,970,255 |
| - UNICEF | 48,000,000 | 48,000,000 | - |
| එකතුව | 4,484,156,677 | 2,988,831,991 | 1,495,324,686 |

(ආ) පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. මිලියන 4484 ක ඇස්තමේන්තු වටිනාකමකට වූ ව්‍යාපෘති යෝජනා 1483 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| ව්‍යාපෘති වල කාර්ය සාධන මට්ටම | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද වැඩ යෝජනා ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. |
| සම්පූර්ණයෙන් නිමකළ | 727 | 190 | 917 | 4,484,156,677 |
| 50% ට වඩා වැඩියෙන් නිමකළ | 26 | 18 | 44 | |
| 50% ට වඩා අඩුවෙන් නිමකළ | 22 | 4 | 26 | |
| ආරම්භකර නොතිබූ | 496 | - | 496 | |
| එකතුව | 1271 | 212 | 1483 | |